# ඍග්වේදයෙන් හෙළිවන වෛදික සමාජය

බලදොර ඉන්දජෝති හිමි

ලෝක සාහිත්‍යයේ දැනට ශේෂ කෘති අතරින් ඉපැරණි ම කෘතියක් ලෙස ද ඉපැරණි ම ආගමික කෘතියක් ලෙස ද ඍග්වේදය සම්භාවනාවට පාත්‍ර වේ. අදට සහශ්‍රවර්ෂ තුනකටත් පෙර අද පවත්නා තත්ත්වයට පත් වූ ඍග්වේද සංහිතාව මුඛ පරම්පරාගතව පැවත ආවක් බවට විශ්වාස කෙරේ. වෛදික ජනයා තමන්ට හැඟුණ දැනුණ දේ ප්‍රකාශ කළේ, ළ ගන්නා සුළු විලාශයකිනි. කවදත් කොතැන දීත් කුමන භාෂාවක වුවත් මිනිසා තම අදහස් සෞන්දර්යයෙන් ප්‍රකාශ කළේ පද්‍ය යොදා ගනිමිනි. ප්‍රාථමික මිනිස් සමාජය තුළ ද එය එසේ ම සිදුවිය. ඒ අනුව කවියේ ආරම්භය ද ඍග්වේදය තුළින් ප්‍රකට වේ. එපමණක් නොව අදාළ සිද්ධිය හෝ පුද්ගලයා හෝ ස්ථානය ද ඒ දෑ වර්ණනයට යොදා ගත් භාෂාවද සරසා එනම් අලංකාර කොට ඉදිරිපත් කිරීම එකලදී ද සිදුවිය. ඍග්වේදයේ ම භාවිත අලංකාර යන පදය තුළින් ද අදහස් වන්නේ සැරසීම අලංකාර කිරීම යන්න යි. ඒ අනුව තත් පද්‍ය රචකයින් වර්ණනාවල දී අදහස් අලංකාර කොට ඉදිරිපත් කිරීමට පෙළඹුණ නිසාවෙන් තත් සමාජීය තතු යම් ආවරණයකට යටත් ව ඇත. ඒ තොරතුරු මතු කරගැනීම විචාරකයා සතු කාර්යය කි. ඍග්වේදය භාරතීය ප්‍රාථමික සමාජ තොරතුරු පිළිබිඹු කොට දක්වන දර්පණයක් වැනියැයි කීම සාධාරණය. තත් කාලීන මිනිසාත් සමාජයත් සංස්කෘතියත් පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් ඒ තුළින් මතුකර ගැනීම අසීරුවෙන් තමුදු කළ හැකි වනු ඇත.

වෛදික සමාජය ඉපැරණි යුගයට අයත් ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට සබඳතා දක්වන අනාර්ය එනම් සවදේශීය ජනතාවගෙන් සහ ආක්‍රමණික ජාතියක් වශයෙන් වයඹ දෙසින් ඉන්දියාවට පැමිණි ආර්ය, එනම් සංක්‍රමණික ජන කොට්ඨාසයක සුසංයෝගයකි. භාරතයේ විසූ මුල් පදිංචි කරුවන් ම්ලේච්ඡ ජනතාවක් යැයි ද පළමු වරට දියුණු ශිෂ්ටාචාරයක් ගොඩනගන ලද්දේ ආර්යයන් විසින් යැයි ද මීට දසක කීපයකට පෙර බොහෝ උගතුන්ගේ පිළිගැනීම විය. එහෙත් වර්තමානයේ වැඩිදෙනා පිළිගන්නා අයුරින් ඉන්දියාවේ විසූ ආදිතම ජනතාව ශිෂ්ට ජනතාවක් වූ අතර ආර්යයන් පැමිණෙන්නට පෙර පටන් ම මුහුකුරා ගිය උසස් සභ්‍යත්වයකට හිමිකම් කිව හැකි දියුණු ශිෂ්ටාචාරයකට අයත් මොහෙන්ජෝදාරෝ සහ හරප්පා ශිෂ්ටාචාරයන්හි විසූ සාමකාමී මනුෂ්‍ය කොට්ඨාසයක් විය. එම ප්‍රදේශවල කළ පුරාවිද්‍යා පර්යේෂණ ඍග්වේදයේ ගීතිකා සමග සැසඳීමෙන් ඉන්දු නිම්න වැසියන්ගේ සමාජීය තොරතුරු රැසක් හෙළි කරගෙන තිබේ. විශේෂයෙන් ම ආර්යයන් පැමිණ අනාර්යයන් සමග ඇතිකරගත් ගැටුම් පිළිබඳ ව හෙළිවන තොරතුරු ඒ අතර වැදගත් වේ.

ආක්‍රමණික ආර්යයන් පැමිණ ස්වදේශිකයන් විනාශ කර ඔවුන්ගේ ගම්, නගර, වස්තුව තමන් අයත් කරගැනීමට උත්සාහ ගත් බවට සැකයක් නැත. හරප්පා ශිෂ්ටාචාරයට අයත් පුරාවස්තු හා ඍග් වේදයේ වාර්තාගත කරුණු අතිශයින් ගැලපේ. ඍග්වේදයේ ඒ තොරතුරු අපට හමුවන්නේ ඍජු වාර්තා ලෙස නොව සාහිත්‍ය තොරතුරු ලෙසින් වර්තමාන පාඨකයාට විශ්වාස කළ නොහැකි තරමට මිථ්‍යාකථා, දේවකථා, තත්ත්වයට ආරෝපණය කිරීමකිනි. නමුත් ඒ තුළින් ඓතිහාසික කරුණු මතුකර ගැනීමෙන් තත් සමාජය පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීම කළ හැකිය.

ඍග්වේදයේ ඉන්ද්‍ර සම්බන්ධයෙන් දැක්වෙන තොරතුරුවලට අනුව ඔහු සටන්කාමී වීරයෙකි. ''පුරද්භි-පුරන්දර්''වැනි අභිධාන ද යොදා ගනිමින් ඉන්ද්‍ර වර්ණනා කරනු දැකිය හැකිය. පුරයන් ජයගත්



තැනැත්තා යන අදහසක් ඒවායින් ලැබේ. ඉන්ද්‍ර දස්‍යූන්ගේ බලකොටු ද සියගණන් මාලිගා ද විනාශ කළ බව ඍග්වේදයේ දැක්වේ. මේ උත්කර්ෂයෙන් දැක්වෙන්නේ ආර්යයන් ඉන්දුනිම්න ශිෂ්ටාචාරය විනාශ කළ අවස්ථාව බව පුරාවිද්‍යාඥයෝ විශ්වාස කරති. ''හරූපීය'' නම් ස්ථානයක පැවති සටනක් ගැන ඍග්වේදයේ කියවෙන බැවින් ඒ කියවෙන්නේ හරප්පා නගරය බව විශ්වාස කෙරේ. හරප්පාවේදී අවි ගබඩා ගිනිතබා විනාශ කර ඇත. එම නගරය ගින්නකින් විනාශ වූ බවට පුරාවිද්‍යා සාක්ෂ්‍ය ද පවතී.

තවද ''බලවෘත්‍රහා''යන නාමයකින් ඉන්ද්‍ර හඳුන්වනු ඍග්වේදයෙන් දැකගත හැකිය.''බල සහ වෘත යන දෙදෙනා නැසූ'' යනු එහි අර්ථය යි. මේ කියවෙන බල සහ වෘත්‍ර යනු අනාර්ය නායකයන් වන්නට ඇතැයි යන්න විචාරක අදහසයි. වෘත්‍ර විසින් වලක්වාගෙන සිටි ජලය මුදාහැරීමට ඉන්ද්‍ර කටයුතු කළ බව ඍග් වේදයේ දැක්වේ.

**''යෝ හත්වාහිමරිණාත් සප්තසින්ධූන්.........''**(ඍග් ii-12-3)
(යමෙක් වෘත්‍ර නම් සර්ප අසුරයා මරා සප්ත ගංගා මුදාහැරියේද.......)
ඉන්දු නිම්න සීමාවේ නගරයන් ආරක්ෂා කර ගැනීම සඳහා බැඳ තිබූ වේල්ල කඩා බිඳ දමා අනාර්යයන්ගේ නගර විනාශ කරන්නට ඇතැයි මෙයින් විශ්වාස කළ හැකිය. ජලයෙන් වූ විනාශයක් පිළිබඳ ව ද පුරාවිද්‍යා සාධක පවතී.

ඍග්වේදාගත ''ගවේෂ්ටි'' යන වචනය ඔස්සේ ද මේ සම්බන්ධයෙන් තොතුරු රැසක් හෙළි වී තිබේ.''යුද්ධ-සංග්‍රාම''වැනි වචන වෙනුවට ඍග් ගී තුළ භාවිත වී ඇත්තේ ''ගවේෂටි'' යන්න යි. ඒ අනුව මේ වචනය භාවිත කළේ යුද්ධය, සටන වැනි අදහසක් ලබා ගැනීමටය. ආර්යයන් යුද්ධ කළේ ස්වදේශිකයන්ගේ වස්තුව පැහැරගැනීම සඳහායි. ස්වදේශිකයන්ගේ වස්තුව වූයේ ගවයන් ය. ඒ අනුව ගවයන් ලබාගැනීම සඳහා ආර්යයන් සටන් කළ බව පැහැදිලි ය. ඍග්වේදයේ එන පහත ගීතිකාව ද මේ කරුණ තව දුරටත් සනාථ කරයි.

''යේනේමා විශ්වා ච්‍යවනා කෘතානි
යෝ දාසං වර්ණමධරං ගුහාකඃ
ශ්වඝ්නීව යෝ ජිගීවාං ලක්ෂමාදද්
අර්යඃ පුෂ්ටානි ස ජනාස ඉන්ද්‍රඃ'' (ඍග් ii-12-4)

(යමෙකු විසින් මේ විශ්වය අස්ථිර බවට පත් කළේ ද, යමෙක් අනාර්ය වර්ණය යටපත් කළේ ද, සැඟවූයේ ද, යමෙක් දිනන සුළු සූදු කෙළින්නෙකු ඔට්ටුව දිනන්නාක් මෙන් සතුරු ධනය පැහැරගත්තේද, ජනයිනි ඒ ඉන්ද්‍රයි.)

මෙලෙස ඉන්ද්‍ර නමින් හැඳින්වෙන ආර්යයන්ගේ ප්‍රධාන යුධ නායකයා ස්වදේශිකයන් ව විනාශ කළ බවටත් ඔවුන් සතු සියලු වස්තුව පැහැරගත් බවටත් බොහෝ තොරතුරු ඍග්වේදයේ අන්තර්ගතය. සමහර විට පසුකාලීන ව මේ යුධ නායකයා දේවත්වයෙන් වර්ණනා කරන්නට ඇත.

කෙසේ නමුත් අනාර්යයන් සම්පූර්ණයෙන් ම විනාශ කරන්නට ආර්යයන්ට අවශ්‍ය නොවීය. ඔවුන්ගේ නායකයන් මරා සටනින් තමන් ජයගෙන වස්තුව හිමිකරගත් පසු ඉතිරි වූ ස්වදේශිකයන් ද සිටි බවට සාධක හමුවේ. ඔවුන් ආර්යයන්ගේ බැලමෙහෙවර කරමින් යටත් පිරිසක් ලෙස වාසය කළ බව පෙනේ. ආර්යයන් අනාර්යයන් සමඟ යම් යම් සබඳතා පැවැත් වූ බවට ද තොරතුරු හමුවේ.

මේ අනුව ආර්යයන් ආක්‍රමණික පිරිසක් ලෙස ඉන්දියාවට පැමිණ පදිංචි වූහ. මෙසේ ආරම්භ වූ මෙම සමාජයේ පසුකාලීන ව වර්ධනය වූ කුල ගෝත්‍ර ක්‍රමය පිළිබඳ ව සැලකීමේ දී ස්වදේශිකයන් පහත් කුල ගෝත්‍ර ඇත්තවුන් සේ ද ආර්යන් උසස් කුල ගෝත්‍ර ඇත්තවුන් සේද සලකා කටයුතු කර ඇති බව පෙනේ. නිරන්තරයෙන් ම ස්වදේශිකයන් දාස, සේවක තත්ත්වයට තල්ලු කර තිබේ. ස්වදේශිකයන්ට පහත් රැකියා ද ආර්යයන්ට උසස් රැකියා ද වශයෙන් වැඩ කටයුතු කොටස් කරගෙන ජීවනෝපාය ගෙන යාමෙන් කලක්



ගත වූ පසු එය පදනම් කරගෙන තත් සමාජීය කුල ක්‍රමය ස්ථිර වී ඇති බව පෙනේ.

ඍග්වේද කාලයේ අධ්‍යයන, අධ්‍යාපන කටයුතු, ආගමික කටයුතු, පාලන කටයුතු, කෘෂිකර්මය, වෙළඳාම හා නොයෙක් කර්මාන්ත ද එක එක පරම්පරාවලට වෙන් වෙන් වශයෙන් පැවරී තිබිණ. කල් යෑමේ දී තම පරම්පරාවේ මුලින් පැවති එකී රැකීරක්ෂා ජන්ම දායාද වශයෙන් උරුම වී එය ම කුල භේදය ගොඩ නැඟීමට මුල් විය. එකී බෙදීමේ ප්‍රධාන මූලාශ්‍රය ඍග් X-90-12 වන ''බ්‍රාහ්මණස්‍ය මුඛමාසීත්'' යන ගීතිකාවෙන් හෙළි වේ.

ඍග්වෛදික සමාජයේ ආගමික අංශය ගැන සැලකීමේ දී මුල් කාලයේ ස්වභාව ධර්මය නිසි ලෙස හඳුනා නොගත් ජනයා ඒ තුළ අදෘෂ්‍යමාන බලයක් ඇතැයි ද එයින් මිනිසාට සුබ හෝ අසුබ වෙතැයි ද කල්පනා කළහ. චන්ද්‍ර, සූර්ය, තාරකා, ගර්ජනා, ජලාශ ආදියෙහි වේගය හා ශක්තිය දරාගත නොහැකි ඔවුන්ගේ බුද්ධියට එහි යම් කිසි බලයක් ඇතැයි වැටහී එය දේවත්වයෙන් සලකන්නට පටන් ගත්හ. පසුකාලීනව එම දෙවියන්ට උසස් තැනක් හිමි කෙරිණි. මෙසේ බොහෝ දේව කොට්ඨාශයක් ඇතිවීම බහු දේව වාදී සංකල්පය ලෙස හැඳින්වේ. පසුව ප්‍රධානත්වය ගත් දෙවියන්ට තැන දෙමින් ඒක දේව වාදය ද ඉන් පසුව සියල්ල සිදුකරන්නේ දෙවියන් නොව බ්‍රහ්මන්ය යන ඒකත්ව වාදය ද ඇතිවීම වෛදික සමාජයේ ආගමික අංශයට අයත් ය.

ඍග්වෛදික ජනයාගේ සමාජික තත්ත්වය පිළිබඳ ව විමසීමේ දී ඍග්වේදයෙන් පෙනෙන තොරතුරුවලට අනුව ඔවුහු ස්ථිර පදිංචි කරුවන් හැටියට ගෙවල් තනාගෙන ගම් පිහිටුවාගෙන අලංකාරවත් ප්‍රාකාර සහිත නගර ඉදිකරගෙන විසූ බවට ගීතිකාවලින් තොරතුරු ලැබේ. වෛදික ආර්යයා එක් තැනෙක පදිංචි නොවූ සංචාරකයෙකි යන විචාරක අදහස එයින් ප්‍රතික්ෂේප වෙයි.

ඔවුන්ගේ ප්‍රධාන රක්ෂාවන් වී ඇත්තේ ගව පාලනය හා කෘෂි කර්මාන්තය යි. මීට පෙර ද සඳහන් කළ ආකාරයට ආර්යයන් ස්වදේශිකයන් ආක්‍රමණය කළේ ද ධනය තමාට අයත් කර ගැනීම සඳහායි. v-83-8 වන ගීතිකාවෙහි ''ඝෘතේන'' යන වචනය යොදා තිබීමෙන් ගිතෙල් භාවිතයක් තිබූ බවත් එබැවින් ගව පාලනය එකල පැවති බවත් පෙනේ. මේ හැරත් බොහෝ සෙයින් ගවදෙන, වෘෂභයා, කිරි ආදිය උපමා වශයෙන් යොදා තිබීමෙන් ද ඒ බව පැහැදිලි වේ. මේ හැරුණු විට කෘෂි කර්මාන්තයේ යෙදුණු මිනිස්සු සිටියහ. x-34-13 වන ගීතයෙන් සූදුවෙන් පැරදුණු අයෙකුට දූත්වත් සූදුව අතහැර ගොවිතැන ආදී කර්මාන්තවල යෙදෙන ලෙස කරන ප්‍රකාශයකින් එය පැහැදිලි වේ.

**''අක්ෂෛර්මා දිව්‍යඃ කෘෂිමිත්කෘෂස්ව.........''**

යන පාඨයේ ''කෘෂිං කෘෂස්ව'' යනුවෙන් සී සාන ලෙස දක්වයි. මීට අමතර ව වෛදිකයාගේ ජීවන වෘත්තීන් අතර වහල් සේවය ද පැවතිණ. vii-86-7 ගීතයේ ''අරං දාසෝ න මීල්හුෂේ'' යනුවෙන් දාස වෘත්තිය පිළිබඳ ව සඳහන් වීමෙන් ඒ බව අවබෝධ කරගත හැකිවේ. තව ද එකල ගණිකා වෘත්තිය පැවති බව x-34-5 ගීතයේ එන ''ජාරිණීව'' යන වචනයෙන් පෙනේ. වඩු වැඩ, රන් හා යකඩ ආශ්‍රිත කර්මාන්ත දුණු, හී, කඩු, කරත්ත ආදිය සෑදීම වෘත්තීන් ලෙස කළ අය එම සමාජයේ සිටි බව පෙනේ.

වෛදිකයන් ප්‍රවාහන කටයුතු සඳහා රථ භාවිත කළ බව vii-63-2 ගීතයේ රථ ගැන සඳහන් වීමෙන් පෙනේ.

**''...............සමානං චක්‍රං පර්යාවිවෘත්සන්**
**යදෙත ශෝ වහති ධූර්ෂු යුක්තඃ''**

v-83-3 ගීතයේ **''රථීව කශයාශ්වං අභික්ෂිපං''** වශයෙන් ද තවත් නොයෙක් තැන්හි අශ්ව රථ පිළිබඳ ව ද සඳහන් වේ. එමෙන් ම ඔවුන් හෙල්ල, දුණු, හී, පොරෝ ආදී යකඩෙන් තැනූ ආයුධ පිළිබඳ දැන සිටි බව හා ඒවා භාවිත කළ බව i-85-4 ගීතයෙහි **''ඍෂ්ටිභිඃ''** (හෙල්ල) ii-33-10 ගීතයේ **''සායකානි''** (හී) vii-49-1 **''වජ්‍ර'** (වජ්‍රායුධය) ආදී වචන යෙදීම් තුළින් පැහැදිලි වේ. වෛදිකයා



රන් රිදී ආදිය භාවිත කළ බව i-35-2 ''හිරංණ්‍යෙන'' i-85-9 ''හිරණ්‍යම්'' යන වචන භාවිතයෙන් පෙනේ. viii-29-1 ගීතයේ **''යුවඤ්ජ්‍යංක්තේ හිරණ්‍යයම්''**යන සඳහනට අනුව එකල තරුණයින් රන් ආභරණ පැළඳි බව විශ්වාස කෙරේ.

ඍග්වෛදික සමාජයේ වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ ව යම් දැනුමක් පැවති බවට ඍග්වේදයෙන් තොරතුරු ලැබේ. ii-33-2 වන ගීතයේ යම් බෙහෙතක් හේතු කොටගෙන අවුරුදු සියක් ජීවත් වන්නට හැකි බව පැවසීමෙන් පෙනෙන්නේ ඔහු යම් රෝගයකින් මරණාසන්න සිටි නමුත් නැවත එයින් සුව වීමට හැකි වී දීර්ඝායුෂ ලැබූ බවයි. **''සතං හිමා අෂීය භේසජෙභිඃ''** (බෙහෙතින් සියක් හේමන්තයන් අත්කර ගතිමි.) එම සූක්තයේ ම හතර වන ගීයෙන් **''භිෂජාං''** (චිකිත්සකයා) යන වචනයක් ද භාවිතා වීමෙන් එකල වෙදකම පැවති බවට යම් නිගමනයකට පැමිණිය හැකිය.

ඔවුන් යම් ක්‍රමානුකූල ආකාරයකින් අධ්‍යයන ක්ෂේත්‍රය පවත්වාගෙන ගිය බව එසේ නැත්නම් ගුරුවරුන් හමුවට පැමිණ ශිෂ්‍යයන් වශයෙන් යම් අධ්‍යයනයක් ලැබූ බව vii-103-5 ගීතයේ ''ශික්ෂමාණ (ශිෂ්‍යයා) - ශාක්තස්‍ය'' (ගුරුවරයා) ආදී වචන හමුවීමෙන් පෙනේ. එම ගීතයේ අදහසින් තේරුම් ගත හැකි ආකාරය නම් එකල ගුරුවරයා කියූ දේ නැවත නැවත කියවීමෙන් පාඩම් කළ බවකි.

**''යදේෂා මන්‍යෝ අන්‍යස්‍ය වාචාං**
**ශාක්තස්‍යෙව වදති ශික්ෂමානඃ..........''**

(යම් කල්හි ඉගෙන ගන්නා තැනැත්තෙකු ගුරුවරයාගෙන් උගන්නාක් මෙන් ඔවුන්ගෙන් එකෙක් අනෙකාගේ වචන යළි යළිත් කියයි ද)

ඍග්වෛදික සමාජයේ මිනිසා වර්ෂ ක්‍රමයක් භාවිතා කළ බව vii-103-1 හි **''සංවත්සර''** යන වචනය භාවිත වී තිබීමෙන් පෙනේ. එමෙන් ම එම සූක්තයේ 7 වන ගීතයෙහි ''සංවත්සරස්‍ය අහඃ'' යනුවෙන් සඳහන් වීමෙන් සාංවත්සරික දින එනම් යම් යම් උත්සව ආදිය පැවැත් වූ දින තිබූ බව සිතිය හැකිය.

ඍග්වෛදික සමාජයේ ද සොරකම්, සුරා පානය, සූදුව, පරස්ත්‍රී සේවනය ආදී දුසිරිත් පැවතුණු බවට සාක්‍ෂ්‍ය හමුවේ. vii-86-5 වැන්නේ ''පශුතෘපං'' යන්නෙන් හරක් හොරෙකු පිළිබඳ සඳහන් කරයි. තව ද viii-48 වැනි සූක්තය සුරාව (සෝම පානය) ගැන කියවෙන ප්‍රධාන සූක්තයකි. vii-86-6 හිද ''සුරා'' යන වචනය මැනවින් භාවිත වනු පෙනේ.

සූදු ක්‍රීඩා අතර දාදු ක්‍රීඩාව එකල බහුල ව පැවතිණ. x-34 සූක්තය පුරාවට ම කියවෙන්නේ සූදු කාරයෙකුට වන විපත් පිළිබඳව ය. එහි 11 වන ගීතිකාව මෙසේය.

''ස්ත්‍රියං දෘෂ්ට්වාකිතවං තතාප
නොෂා ජායා සුකෘතං ච යෝනිම්
පූර්වාහ්ණේ අශ්වාන්යුයුජේ හි බභ්‍රූන්
සෝ අග්නේරන්තේ වෘෂලඃ පපාද''

(සූදුකාරයා අනුන්ගේ භාර්යාව සහ ඇගේ මැනවින් සැලසසුම් කරන ලද නිවස දැක තමා තවයි. උදේ පටන් දාදුකැට නැමති අශ්වයින් බැඳගනී, දවස කෙලවර සිගන්නෙකුව ගින්නෙහි වැටෙයි.)

එකල පරස්ත්‍රී සේවන දුරාචාරය පැවති බව x-34-4 ගීතයේ සඳහනකින් පෙනේ .සූදුවෙන් පැරදුණ විට ලැබෙන විපාක දක්වෙන එය මෙසේයි.

''අන්‍යෙ ජායාං පරි මෘශන්ත්‍යස්‍ය
යස්‍යාගෘධද්වේදනේ වාජ්‍යක්ෂඃ............''

(යමෙකුගේ වස්තුව කෙරෙහි ජයග්‍රාහී දාදුව ලොල් වූයේ ද ඔහුගේ බිරිය අන්‍යයෝ ආලිංගනය කරත්.)

තවද එකල මිනිසුන් හිස කෙස් කැපීම, රැවුල කැපීම ආදිය ද සිදුකරගෙන අලංකාරවත් ව ජීවත්වූ බවට සාක්‍ෂ්‍ය ii-35-12 ගීයෙහි එන ''බිල්මෛර්'' යන වචනයෙන් ලැබේ. එහි අදහස ''හිස රැවුල් බෑමෙන්'' යනුයි.



එකල ද පියා මූලික කරගත් පවුල් ඒකක ක්‍රමයක් පැවතුණි. කාන්තාව භාරතීය සමාජයේ පශ්චාත් සමයට වඩා නිදහස් සහ ගෞරවාන්විත තත්වයක් දරාඇත.

මෙකල ජනතාවගේ ඇඳුම් උඩු සහ පහළ කොටස් වලින් යුක්ත විය. ඔවුන් ඇඳුම් නිමවන ලද්දේ බැටළු ලොම් වලිනි. මොවුන්ගේ ප්‍රධාන ආහාර වූයේ බත්, එලවුළු, පළතුරු යනාදියයි. මාංශ අනුභවය ද පැවතුණි. ප්‍රධානවශයෙන් ම ඔවුන් අනුභව කළ මාංශ වර්ගය වූයේ ගව මාංසයි. යාගයට යොදාගත්තේ ද ගවයා පමණි. සෝම පානය හැරුණු විට සාමාන්‍ය අවස්ථාවල භාවිතයට සුරාව නිපදවා ඇත.

ඔවුන් සංගීතයට හා නැටුමට ප්‍රියකළ බවද පෙනේ ''දුන්දුභි''බෙරය, ''වාණ'' වස්දඬු, ''වීණා'' වීණාව, ඔවුන් භාවිතා කළ සංගීත උපකරණ අතර තිබිණි. කාන්තාවෝ නැටුම ප්‍රගුණ කළහ.

මෙලෙස විමර්ශනය කරන විට ඍග්වෛදික සමාජයේ ආරම්භයත් එහි ආගමික, සාමාජික හා සංස්කෘතික තත්ත්වයන් පිළිබඳවත් මනා අවබෝධයක් ඍක් සූක්ත අධ්‍යයනයෙන් ලබාගත හැකි බව පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ

1. ඍග්වේද සංහිතාව,මැක්ස් මුලර් සංස්කරණය

### ද්විතීයික මූලාශ්‍ර

1. තිලකසිරි ජයදේව, වෛදික සාහිත්‍ය, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1988.
2. කළුපහන ජිනදාස, භාරතීය දර්ශන ඉතිහාසය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1963.
3. සෝමාරාම හිමි ගල්ගමුවේ, සංස්කෘත සාහිත්‍යය, විද්‍යාලංකාර මුද්‍රණාලය, කැලණිය,1952.
4. Bloomfield, M,Religion of the veda, New York, sohrder, Indian Literature and Culture,1908.

### සඟරා

1. සාධනා, දෙවැනි කලාපය,1961-62, විද්‍යාලංකාර සංස්කෘත පර්ෂදය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය.